**සීමාසහිත ලිට්රෝ ගෑස් ලංකා සමාගම - 2017**

**-------------------------------------------------------**

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ පාඩු ප්‍රකාශනය සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ ("සමාගම") සහ එහි හිමිකම් ගිණුම් ආයෝජක සමාගමේ ("සමාගම හා ආයෝජක") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2 මූල්‍ය ප්‍රකාශන

--------------

### 2.1 මතය

-----

මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා විසින් දරන්නා වූ මතය වේ.

### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------------

2007 අංක 7 දරණ සමාගම් පනතේ 163 (2) වගන්තියෙහි අවශ්‍ය පරිදි පහත සඳහන් කරුණු දක්වමි.

අ. මතය සඳහා පදනම සහ විගණනයේ විෂය පථය සහ සීමා කිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

ආ. - විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරණ සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

### 2.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

------------------------------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | |
| (i) මාර්ගෝපදේශ අංක 4.2.2 | සෑම මාසික මණ්ඩල රැස්වීමකදීම මූල්‍ය හා භෞතික වශයෙන් වූ මාසික කාර්ය සාධන ප්‍රකාශන, මෙහෙයුම් ප්‍රකාශ, මුදල් ප්‍රවාහ ප්‍රකාශන, ද්‍රවශීලතා ප්‍රකාශන, ණය ගැනීම් සහ සේවක තනතුරු, නව බඳවා ගැනීම් ඇතුළුව මානව සම්පත් පිළිබඳ ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ඉදිරිපත් කර නොමැත. |
| (ii) මාර්ගෝපදේශ අංක | අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වාර්තා රේඛීය අමාත්‍යාංශයේ |

| | |
|---|---|
| 4.3 | ලේකම්වරයාහට රැස්වීමෙන් දින 10ක් ඇතුලත යැවිය යුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (iii) මාර්ගෝපදේශ අංක 5.1.1 | සමාගම වසර 3 ක් සඳහා සංයුක්ත සැළැස්මක් පිළියෙල කළ යුතු අතර එය වාර්ෂිකව යාවත්කාලීන කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද යාවත්කාලීන සංයුක්ත සැළැස්මේ පිටපත් යාවත්කාලීන වාර්ෂික අයවැය සමග මූල්‍ය වර්ෂයේ ආරම්භයට දින 15 කට පෙර රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම එම අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (iv) මාර්ගෝපදේශ අංක 5.2.2(අ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන අයවැයට ඇතුළත් කිරීමට පෙර රු. මිලියන 716 ක ඇස්තමේන්තුගත පිරිවැයකින් යුත් හම්බන්තොට ගෑස් පිරවුම්හල ඉදිකිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණි. |
| (v) මාර්ගෝපදේශ අංක 5.2.2(ආ) | 2017 වර්ෂය තුළ රු. මිලියන 24 ක පිරිවැයකින් යුත් මෝටර් වාහන (05) මිලදී ගැනීම සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය සමාගම විසින් ලබාගෙන නොතිබුණි. |
| (vi) මාර්ගෝපදේශ අංක 5.2.4 හා 5.2.5 | මූල්‍ය වර්ෂය ආරම්භ වීමට මාස 03 කට පෙර 2017 වර්ෂයේ කෙටුම්පත් අයවැය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතු වුවත්, එය 2016 දෙසැම්බර් මාසයේදී අනුමත කර තිබුණි.<br>තවද, මාර්ගෝපදේශය මගින් නියම කර ඇති පරිදි සමාලෝචිත වර්ෂය සඳහා අනුමත අයවැයේ පිටපත් රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (vii) මාර්ගෝපදේශ අංක 8.3.1 | රු. 15,453,607 ක් 2017 දී ප්‍රචාරණය සඳහා වියදම් කර තිබුණ ද, ප්‍රචාරක ආයතනය ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම හරහා තෝරා ගෙන නොතිබුණි. |
| (viii) මාර්ගෝපදේශ අංක 8.3.8 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව 2017 වර්ෂය තුළ විවිධ පාර්ශවයන්ට රු .5,272,730 ක් පරිත්‍යාග කර තිබුණි. |
| (ix) මාර්ගෝපදේශ අංක 8.7 | මාර්ගෝපදේශයේ විධිවිධානවලට පටහැනි වන ආකාරයට 2016 සිට 2018 දක්වා කාල සීමාව සඳහා සමාගම සහ එහි සේවක සංඛ්‍යාවෙන් 60 ක් නියෝජනය කරනු ලබන ජාතික සේවක සංගමය අතර 2016 අප්‍රේල් 20 දින ඇති කර ගත් ගිවිසුමට අනුව, උපයන විට ගෙවීම් බද්ද පළමුව සේවකයා විසින් දැරිය යුතු අතර එක් එක් සේවකයා විසින් දරනු ලබන එම උපයන විට ගෙවීම් බද්දෙහි සාමාන්‍යය සමාගම විසින් සේවකයින්ට දීමනාවක් ලෙස අඛණ්ඩව ආපසු ගෙවිය යුතුය. |
| (vi) මාර්ගෝපදේශ අංක 9.2 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව යටතේ අනුමත කාර්ය |

| | | |
|---|---|---|
| | | මණ්ඩලයක් සහිතව ලියාපදිංචි කර ඇති සංවිධාන ව්‍යුහයක් සමාගම සතුව නොපවතින අතර නව සේවක පිරිසක් බඳවා ගැනීමේදී හෝ අතිරික්ත සේවක සංඛ්‍යාවක් සිටින අවස්ථාවන් වලදී සමාගම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර සුදුසු පියවර ගෙන නොමැත. |
| (vii) | මාර්ගෝපදේශ අංක 9.3 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය මත අමාත්‍යාංශය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රියාපටිපාටියක් සමාගම සතුව නොමැත. |
| (ආ) | 2011 සැප්තැම්බර් 01 දිනැති අංක පීඊඩී/58 (2) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය. | චක්‍රලේඛයේ ඇති ආයතන වර්ගීකරණයන්ට අනුව ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම "එෆ්" කාණ්ඩයට අදාළ බව පෙනී යයි. ඒ අනුව මෙම උප කාණ්ඩය යටතේ ගැනෙන රජයේ ව්‍යාපාරවල ප්‍රධාන විධායක නිලධාරීන්ට දීමනා ගෙවීම සහ නියමයන් සහ කොන්දේසි අදාළ ආයතන වල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඊට සමාන ආයතනයන් භාවිතා කරනු ලබන තරඟකාරී වෙළඳපොල අනුපාත සහ අදාළ පුද්ගලයාගේ අධ්‍යාපන හා නිපුණතා මට්ටම සලකා බැලීමෙන් අනතුරුව ගරු. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ එකඟතාවය මත තීරණය කරනු ලැබේ.<br>කෙසේ වුවද, සේවක වැටුප් තීරණය කිරීම සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ එකඟතාවය සමාගම විසින් ලබා ගෙන ඇති බව තහවුරු කර ගැනීමට විගණනයට නොහැකි විය. |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - මාර්ගෝපදේශ අංක 4.2.1 | අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සමාගම විසින් සකස් කර නොතිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුල සමාගමේ සහ එහි ආයෝජකයාගේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 419.85 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු.මිලියන 4,895.08 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 4,475.23 ක පිරිහීමක් දැක්විණි. සමාලෝචිත වර්ෂය තුළ විකුණුම් ආදායම රු.මිලියන 5,468.13 කින් හෙවත් සියයට 22 කින් ද විකුණුම් පිරිවැය රු.මිලියන 9,605.68 කින් හෙවත් සියයට 49 කින් ද වැඩි වී තිබූ අතර එය මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

### 3.2.1 වැදගත් ගිණුම් කරණ අනුපාත

2017 වර්ෂය හා පෙර වර්ෂය සඳහා සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | 2017 % | 2016 % |
|---|---|---|
| **ලාභදායීත්ව අනුපාත (ප්‍රතිශතය)** | | |
| දළ ලාභ අනුපාතය | 4 | 21.5 |
| ශුද්ධ ලාභ අනුපාතය | 0.86 | 13.98 |
| වත්කම් මත ප්‍රතිලාභය | 1.05 | 14.73 |
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය | 1.24 | 18.75 |
| **ද්‍රවශීලතා අනුපාත (වාර ගණන)** | | |
| ජංගම අනුපාතය | 3.07:1 | 3.48:1 |
| ක්ෂණික අනුපාතය | 2.67:1 | 3.15:1 |

සමාගමේ දළ ලාභ අනුපාතය හා ශුද්ධ ලාභ අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 17.5 ක හා සියයට 13.12 ක පිරිහීමක් පෙන්නුම් කර තිබුණි. එමෙන්ම, ද්‍රවශීලතා අනුපාත ඉකුත් වර්ෂයට සාපේක්ෂව අඩු වී ඇත. වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සහ යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 13.68 කින් සහ සියයට 17.51 කින් අඩු වී තිබුණි. ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයෙහි සමාගමේ ලාභදායි සහ ද්‍රවශීලතා තත්ත්වයෙහි පිරිහීමක් තිබුණු බව නිරීක්ෂණය විය.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ කටයුතු

(අ) 2013 ජුනි මාසය තුළදී එල්පී ගෑස් ප්‍රමාණයක් ආනයනය කිරීම සඳහා වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු ලෙස රු. මිලියන **15.5** ක මුදලක් සමාගම විසින් ගෙවා තිබුණි. කෙසේ වුවද, නැව් බඩු තොගය අවලංගු කර තිබූ අතර පසුව මෙම මුදල ලැබිය යුතු මුදලක් ලෙස හඳුනාගෙන තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම මුදල අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග සමාගම විසින් ගෙන නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු බහාලුම් තැන්පතු ශේෂය රු. මිලියන 4.9 ක් වූ අතර ඉන් රු. මිලියන 4.55 ක මුදලක් 2006 සිට 2014 දක්වා කාල පරිච්ඡේදයට අදාළ විය. කෙසේ වුවද, දීර්ඝ කාලයක් ගත වුවද එම මුදල අයකර ගැනීමට සමාගම සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.2 නිෂ්කාර්ය වත්කම්**

සමාගමේ පෙර පරිපාලන සමාගමක් වන කළම්බු ගෑස් කම්පැනි ලිමිටඩ් විසින් 1986 වර්ෂයේදී රු.මිලියන 13 වටිනාකමකට මිලට ගත් ඔරුගොඩවත්ත ඉඩම සඳහා සමාගම නමින් ඉඩම් ඔප්පුවක් ලබාගෙන නොතිබුණ අතර මෙම ඉඩම එය මිලදී ගත් දා සිටම කිසිදු මෙහෙයුම් කටයුත්තක් සඳහා භාවිතා කර නොතිබුණි.

**4.3 මතභේදයට තුඩු දුන් ගණුදෙනු**

2016 ඔක්තෝබර් 30 දින සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවට අනුව, සමාගමේ නව ව්‍යාපෘති හා ව්‍යාප්ති සැලසුම් පිළිබඳව අමාත්‍යාංශය සහ සමාගම සම්බන්ධීකරණය කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසාය අමාත්‍යාංශය විසින් නම් කරන ලද අමාත්‍යාංශ සම්බන්ධීකාරකවරුන් 04 දෙනෙකු පත් කරන ලදී. මේ යටතේ, එම සම්බන්ධීකාරකවරුන් සඳහා වේතන ලෙස රු. 3,600,000 ක් සහ ඉන්ධන සහ නඩත්තු වියදම් ලෙස රු. 1,041,197 ක් සමාගම විසින් දරනු ලැබුව ද, සම්බන්ධීකරණ කටයුතු සිදු වු බව තහවුරු කිරීම සඳහා විගණනයට එවැනි ව්‍යාපෘති හා ව්‍යාප්ති සැලසුම් පිළිබඳ තොරතුරු ලැබී නොතිබුණි.

**4.4 මෝටර් වාහන භාවිතය**

අර්ධකාලීනව සමාගමට සේවය කරන සභාපතිවරයාට මෝටර් වාහන දෙකක් පවරා තිබුණි.

**4.5 වෙළඳපොළ කොටස**

එල්පී ගෑස් අංශය අඛණ්ඩව වර්ධනය වන අතර සීමාසහිත ලිට්රෝ ගෑස් ලංකා සමාගම වෙළඳපොළ නායකත්වයට පත් වී තිබුණි. සමාගම සඳහන් කළ පරිදි, 2017 වර්ෂයේදී ශ්‍රී ලංකා වෙළඳපොළ සඳහා එල්පී ගෑස් අවශ්‍යතාවයෙන් සියයට 72 ක්ම සපයා තිබුණේ මෙම සමාගමයි. සීමාසහිත ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ විකුණුම් පරිමාව සමාලෝචිත වර්ෂය තුළදී හා පෙර වර්ෂ 3 තුළ සැලකිය යුතු ලෙස වර්ධනය වී තිබුණි.

**5 තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකරගැනීම**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව, ලිට්රෝ ගෑස් ලංකා සමාගම විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තිරසාර සංවර්ධන අරමුණු ලෙස තිරසාර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම, දිළිඳුකම තුරන් කිරීම,සෞඛ්‍ය සම්පන්න ජීවිත සුරක්ෂිත කිරීම සහ භෞමික පරිසර පද්ධති ආරක්ෂා කිරීම ආදී අරමුණු හඳුනාගෙන තිබුණද ඒ හා සම්බන්ධවන ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සංධිස්ථානයන්ද ඉලක්ක මත ළඟා වීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී සමාගමේ කාර්යයන් කෙරෙහි ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව උනන්දුවක් දක්වන බව හඳුනාගත හැකිය. කෙසේ වුවද, ඉලක්ක සකස් කිරීමේ දී ඔවුන්ගේ සහභාගීත්වයක් සිදු නොවූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ඈ) කිසියම් ක්‍රියාකාරකමක ක්‍රියාකාරිත්වය තක්සේරු කිරීම සඳහා නිවැරදි සංඛ්‍යාන දත්ත වල පැවැත්ම අනිවාර්ය වුවද, ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම තක්සේරු කිරීම සඳහා දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමේ ක්‍රමවේදයක් සමාගම තුළ නොමැත.

(ඇ) තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වාර්ෂික අයවැයට ඇතුළත් කර නොතිබුණි.

(ඉ) තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණයක් නොමැතිකම හේතුවෙන්, ඉලක්කගත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සැලසුම් සකස් කිරීම සහ සකස් කිරීමේ ක්‍රියාවලිය පිරිහීමකට හෝ දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

---------------------------------

### 6.1 අභ්‍යන්තර විගණනය

--------------------

අභ්‍යන්තර විගණනය ඕනෑම සංවිධානයක කළමනාකරණය වෙනුවෙන් වැදගත් සේවාවන් ගණනාවක් සපයනු ලබයි. වංචා හඳුනා ගැනීම සහ වැළැක්වීම, අභ්‍යන්තර පාලනය පරීක්ෂා කිරීම සහ සංවිධානයේ ප්‍රතිපත්ති සහ රජයේ රෙගුලාසි වලට අනුකූල වීම අධීක්ෂණය කිරීම මීට ඇතුළත් වේ. එබැවින් අභ්‍යන්තර විගණනය සංවිධානයේ සංවර්ධනය සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. සමාගමේ අභ්‍යන්තර විගණන ක්‍රියාකාරිත්වය පිළිබඳව පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණකවරයා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වගකිව යුතු වුවද, විගණනයට ලැබී ඇති සංවිධාන සටහනට අනුව, අභ්‍යන්තර විගණකවරයා සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයාට සෘජුවම වගකීමට බැඳේ.

(ආ) අභ්‍යන්තර විගණන ක්‍රියා පටිපාටිය හෝ අත්පොත සමාගම විසින් හඳුන්වා දී නොමැත.

(ඇ) 2017 වර්ෂයෙහි අභ්‍යන්තර විගණන සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර සියලු වැදගත් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි නිසි අවදානම් තක්සේරුවක් කර නොමැත.

(ඈ) අභ්‍යන්තර විගණනයේ නිරීක්ෂණ සහ නිර්දේශ නිතිපතා ඇගයීමට ලක් කර නොතිබුණු අතර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට ද වාර්තා කර නොමැත.

(ඉ) විගණනයට ලද තොරතුරු අනුව, සේවක චේතන සඳහා අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් සිදු කිරීම සීමා කර ඇති බව නිරීක්ෂණය විනි.

(ඊ) අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්ත කර තිබුණේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුළු නිලධාරීන් 3 දෙනෙකු පමණි.

## 6.2 විගණන කමිටු

---------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි සහ 2010 දෙසැම්බර් 14 දිනැති පීඊඩී/55 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි විධිවිධාන වලට අනුව, සමාගම විසින් විගණන කමිටුවක් පිහිටුවා නොතිබුණි.

## 6.3 ප්‍රසම්පාදනයන් සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

------------------------------------------

2017/2018 වර්ෂය සඳහා එල්පී ගෑස් ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) එල් පී ගෑස් මිලදී ගැනීම සඳහා වන 2016/2017 සඳහා වාර්ෂික ගිවිසුම 2017 ජූනි මාසයෙන් අවසන් වුවද, එල් පී ගෑස් ප්‍රසම්පාදනය සඳහා සැපයුම්කරුවෙකු තෝරා ගැනීමට සහ ගිවිසුමකට එළඹීමට සමාගමට 2017 ජූලි මාසය වන විට ද නොහැකි වූ අතර පවත්නා ගිවිසුම තවත් මාස තුනක කාලයක් සඳහා දීර්ඝ කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2017 ඔක්තෝබර් මාසයේදී එළැඹි 2017/2018 වර්ෂය සඳහා වූ වාර්ෂික ගිවිසුමේ නැව් ගාස්තු හා රක්‍ෂණ ගාස්තු සඳහා වන මිල සමඟ සැසඳීමේ දී, 2017 ජූලි සහ අගෝස්තු මාසවලදී ආනයනය කරන ලද එල්පී ගෑස් මෙට්‍රික් ටොන් 46674 ක් වෙනුවෙන් සමාගමට රු. මිලියන 67 ක අමතර ගෙවීමක් දැරීමට සිදු වී තිබුණි.

(ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 මාර්ගෝපදේශයට අනුව, ලංසු විවෘත කිරීම සඳහා සහභාගී වීමේ විධිමත් වාර්තා නියමිත ආකෘති පත්‍රයක පරිදි තබා නොතිබූ අතර එම වාර්තා සටහන් විධිමත් පරිදි පවත්වා ගෙන ගොස් නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.8 මාර්ගෝපදේශයට අනුව අසාර්ථක වූ ලංසුකරුවන්ගේ අඩුලුහුඩුතා සංක්‍ෂිප්තව දැක්විය යුතු වුවද, සමාගම ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ඇ) තෝරාගත් ලංසුකරුගේ ලංසු සුරක්ෂණයේ සඳහන් වන කොන්ත්‍රාත් පාලනය වන නීතිය හෙවත් ගිවිසුම් නීතිය සහ ආරාවුල් විසඳීම සම්බන්ධ නීතිය 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.5.1 සහ 5.4.14 (අ) මාර්ගෝපදේශයන්හි විධිවිධාන වලට පටහැනි වේ.

(ඈ) ලංසු ලේඛණවල සඳහන් වන පරිදි, පූර්ව සැපයුම් පළපුරුද්ද ලංසු ඇගයීම සඳහා වන ප්‍රධාන ඇගයීම් නිර්ණායකයක් වේ. කෙසේ වුවද, 2010 වර්ෂයේ සිට මේ දක්වා සමාගමට එල්.පී.ගෑස් සම්පාදනය කිරීමේ පූර්ව සැපයුම් පළපුරුද්ද ලංසුකරුවන් දෙදෙනෙකුට පමණක් පැවතුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2017/2018 වර්ෂය සඳහා එල් පී ගෑස් සැපයීමේ සුදුසුකම් ලබා ඇත්තේ ලංසුකරුවන් 13 කින් ලංසුකරුවන් දෙදෙනෙකු පමණි. එබැවින් ලංසුකරුවන් දෙදෙනෙකුට පමණක් සුදුසුකම් ලැබීමට හැකිවන පරිදි නිර්ණායක සැකසීමට හේතුව විගණනයේ දී පැහැදිලි නොවුණි.

(ඉ) විගණනයට ලද තොරතුරුවලට අනුව,2016 වර්ෂයේ දී එල්.පී.ගෑස් සැපයුම්කරුවන් දෙදෙනෙකු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත අසාදු ලේඛණගත කර තිබුණි. එසේ වුවද,2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.1 මාර්ගෝපදේශයට අනුව, පැහැරහැර ඇති සැපයුම්කරුවන්ගේ නම් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි පළ කිරීමට සමාගම අපොහොසත් වී ඇත. එමෙන්ම, අසාදු ලේඛණයෙන් ඉවත් කළ පසුව ද එම සැපයුම්කරුවන් දෙදෙනා ඉහත ප්‍රසම්පාදනයට අයදුම් කරන ලද අතර ඉන් එක් සැපයුම්කරුවකු අවම ලංසුකරුවා විය. කෙසේ වෙතත්, එම අවම ලංසුකරුවා මීට වසර 02 කට පෙර අසාදු ලේඛණගත කිරීමට හේතු වූ කරුණු පදනම්ව තාක්ෂණික ඇගයීමේ කමිටුව මඟින් බැහැර කර ඇති අතර අසාදු ලේඛනයෙන් ඉවත්

කිරීමෙන් පසුව පවා එම අවම ලංසුකරු ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ තීරණය විනිවිද බවින් තොර විය.

ඉහත නිරීක්ෂණවලට ප්‍රතිචාර වශයෙන්, සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයා පහත ප්‍රකාශ සිදු කරන ලදී.

"ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.1 සහ 1.2 වගන්තිවලට අනුව, එය ශ්‍රී ලංකා රජය විසින් සම්පූර්ණයෙන් හෝ කොටසකට මූල්‍යාධාර සපයන යම් ප්‍රසම්පාදන ක්‍රියාවකට අදාළ වේ. මෙම ප්‍රසම්පාදනය සඳහා අරමුදල් සපයනු ලබන්නේ සංශෝධිත පරිදි ශ්‍රී ලංකාවේ සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක් වන සීමාසහිත ලිට්රෝ ගෑස් ලංකා සමාගමයි. වගකීමක් නොවුන ද අමාත්‍ය මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් පත් කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහභාගීත්වයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය 2015 සිට විනිවිද භාවයකින් යුත් ප්‍රසම්පාදන ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. තවද, කොටුව මහේස්ත්‍රාත් අධිකරණය 2017 නොවැම්බර් 27 දිනැති නියෝගයක් මගින් සීමාසහිත ලිට්රෝ ගෑස් ලංකා සමාගමේ අරමුදල් පොදු දේපළ ලෙස වර්ග කළ නොහැකි බව නිශ්චිතව දක්වා ඇත."

**7 පද්ධති හා පාලනයන්**

---------------------

විගණන කාලය තුළ පද්ධති සහ පාලනයේ දක්නට ලැබුණු දුර්වලතා වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
| --- | --- |
| අ) වත්කම් කළමනාකරණය | සමාගමේ වත්කම් ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය නොකිරීම. |
| ආ) මානව සම්පත් කළමනාකරණය | බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රියාපටිපාටියක් පිළියෙල කර නොතිබුණි. |
| ඇ) ප්‍රසම්පාදන කළමනාකරණය | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල නොවීම |